මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05/2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.02. 02

**අයවැය චක්‍රලේඛ අංක 02/2023**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ප්‍රධානීන්

## වියදම් පාලනය

පවතින අයහපත් හා අනපේක්ෂිත ආර්ථික තත්ත්වය තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මතුව ඇති දැඩි දුෂ්කරතා පිළිබඳව මේ දක්වා නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ මගින් ඔබව දැනුවත් කර ඇති අතර, විශේෂයෙන් මෑතක දී නිකුත් කළ 2023.01.27 දිනැති අංක 01/2023 හා 2022.12.27 දිනැති අංක 09/2022 දරන අයවැය චක්‍රලේඛ මගින් එම දුෂ්කරතා මග හරවා ගැනීමට ගතයුතු පියවර දැනටමත් ඔබගේ අවධානය යොමු කර ඇත.

02. මෑතකදී කරන ලද බදු සංශෝධන තුළින් අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරාගන්නා තෙක් අත්‍යාවශ්‍යම රාජ්‍ය සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පමණක් අක්මුදල් නිදහස් කිරීමට අංක 23/0201/604/018 දරන 2023.01.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් උපදෙස් ලැබී තිබේ. ඒ අනුව, වැටුප්, විශ්‍රාම වැටුප්, සුබසාධන වියදම්, වෛද්‍ය සැපයීම්, ණය සේවාකරණය සහ ඉහත අයවැය චක්‍රලේඛන මගින් ප්‍රමුඛතාගත කර ඇති අත්‍යවශ්‍ය වියදම් සඳහා පමණක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම මත පවතින ද්‍රවශීලතාවය සලකා බැලීමෙන් පසු අක්මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරනු ලැබේ. මෙම කොන්දේසිවලට පටහැනිව යම් බැඳීමක් නිලධාරීන් විසින් ඇති කර නොගත යුතු අතර, එවැනි නියමයන් කඩකරන නිලධාරීන් පුද්ගලිකවම ඒ සඳහා වගකිව යුතු බව ද අදාල අමාත්‍ය මණ්ඩල තීරණය තුළින් අවධාරණය කර ඇත.

03. රාජ්‍ය ආයතන විසින් වෙනත් රාජ්‍ය ආයතන වෙත ප්‍රතිපාදන මාරු කිරීම මගින් සිදුකළ යුත්තේ ඉහත 02 ඡේදයේ සඳහන් එදිනෙදා අත්‍යාවශ්‍ය හා හදිසි මහජන සේවාවන් පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවාවන් ලබා ගැනීම පමණක් වන අතර, වෙනත් කටයුතු සඳහා ප්‍රතිපාදන මාරු කර එම සේවා ලබා ගැනීමෙන් පසුව අදාල වියදම් පියවා ගැනීමට භාණ්ඩාගාරයෙන් අක්මුදල් ඉල්ලුම් කිරීම නොකළ යුතුය. එසේම, කල් දැමිය නොහැකි අත්‍යාවශ්‍ය මහජන සේවා පවත්වා ගැනීම සඳහා පෞද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතන සමග දැනටමත් බැඳීම් ඇති කරගෙන ඇති සේවාවන් සම්බන්ධයෙන් සහ එදිනෙදා අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා පෞද්ගලික හෝ රාජ්‍ය අංශයෙන් ණය පදනම මත සේවා ලබා ගැනීම් සම්බන්ධයෙන් මෙමගින් බාධාවක් ඇති නොවිය යුතුය.

04. මේ සම්බන්ධයෙන් ඔබගේ විෂයපථයට අයත් සියලු ආයතනවල අදාල නිලධාරීන්ව දැනුවත් කිරීමටත් උක්ත විධිවිධානවලට අනුගතව කටයුතු කරන බවට තහවුරු කර ගැනීම ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඔබගේ වගකීමක් බව කාරුණිකව දැනුම් දෙමි.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව